www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජනාධිපති එක්සත් ජාතීන් හමුවේ කල කතාව: යුද්ධය සහ මානව අයිතීන් උල්ලංඝනය කිරීම් ආරක්ෂා කිරීමට දෙසූ බේගල්

## Sri Lankan president's speech at the UN: lies in defence of war and human rights abuses

**විජේ ඩයස් විසිනි**
**2007 ඔක්තෝබර් 05**

ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ සැප්තැම්බර් 26 වන දා එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලය අමතා කල කතාව මුසාබස් දෙඩීම සහ රැවටීම සම්බන්ධ තවත් ව්‍යායාමයකි. සිය ආන්ඩුව යුද්ධය යලි ආරම්භ කිරීමත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කිරීමත් පිලිබඳව සිය රට තුලින් සහ ජාත්‍යන්තරව එල්ල වන විවේචනයට මුහුන දී සිටින හේ, සටන් සිදු වන්නේ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට සාකච්ඡා මේසයට පිවිසීමට බල කිරීම ඉලක්ක කර ගත් ආරක්ෂක පියවරයක් ලෙස ය යන මුසාව ඇද බෑවේ ය.

කතාව තුල ගැබ් වූ ජාතිකවාදී ආයාචනය සිය රට තුල උපරිම මට්ටමෙන් කා වැද්දීමේ අරමුනෙන් යුතුව සිංහල බසින් කතාව පැවැත්වූ ඔහු මෙසේ පැවසී ය: "අපි මිලිටරි මෙහෙයුම් දියත් කලේ, මිලිටරි ජයග්‍රහනයක් අත් කර ගන්න ඔවුන්ට බැරි බව ත්‍රස්තවාදීන්ට ඒත්තු ගැන්වීමට පීඩනය යොදන්න විතර යි. අපේ අරමුන මේ අවාසනාවන්ත ගැටුමට සාකච්ඡාමය. ගෞරවනීය විසඳුමක් ලබා දීමයි."

එල්ටීටීඊය විනාශ කිරීම ඉලක්ක කර ගත් නව ආක්‍රමනකාරී යුද්ධයක් මුදා හරිමින් ද දිවයින තුල වෙසෙන දෙමල සුලුතරය ත්‍රස්ත කිරීම සඳහා මිලිටරියේ සහාය ලබන ඝාතක කල්ලි මුදා හරිමින් ද 2002 සටන් විරාමය මුලුමනින් ම ඉරා දැමීම සම්බන්ධයෙන් රාජපක්ෂ සැබවින් ම වගකිව යුතු ය. 2005 නොවැම්බරයේ දී ඔහු යන්තමින් ජනාධිපති තනතුර දිනා ගත්තේ, සටන් විරාම ගිවිසුම නැවත ලිවීම ඇතුලු එල්ටීටීඊය කිසි දා නොපිලිගන්නා බවට ඔහු දැන සිටි ඉල්ලීම් මාලාවක් ඇතුලත් කොට ත් ක්‍රියා මාර්ගයක් මත පදනම් වෙමිනි.

බලයට පත් වූ රාජපක්ෂ, ඝාතන සහ ප්‍රකෝප කිරීම්වලින් සමන්විත ආවෘත යුද්ධයකට මිලිටරිය මුදා හලේ ය. අනතුරුව පසු ගිය වසරේ ජුලි මාසයේ දී එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශය අත්පත් කර ගැනීමේ පලමු ආක්‍රමන මාලාව මුදා හලේ ය. සටන් විරාම ගිවිසුම මෙසේ නින්දිත ලෙස උල්ලංඝනය කිරීම ප්‍රෝඩාකාරී ලෙස පින්තාරු කරනු ලැබුවේ ආන්ඩුව සිය පොරොන්දු රැකීමට අසමත් වීමට විරෝධය පෑමක් ලෙසින් එල්ටීටීඊය විසින් වසා දැමුනු මාවිල්ආරු සොරොව්ව යලි විවෘත කර ගැනීම පිනිස අවශ්‍යකර වූ මානුෂීය මෙහෙයුමක් ලෙසිනි.

මාවිල්ආරු අල්ලා ගැනීම "නැගෙනහිර මුදා ගැනීම" ඉලක්ක කර ගත් ආක්‍රමනකාරී මෙහෙයුම් මාලාවක පලමු වැන්න විය. ජුලි මාසයේ දී තොප්පිගල බලය අත් කර ගැනීමෙන් පසු, දිවයිනේ නැගෙනහිර දී එල්ටීටීඊයට එරෙහිව ලත් ජයග්‍රහනය වෙනුවෙන් " සන්නද්ධ හමුදාවලට ආචාර කිරීමට" ආන්ඩුව හා මිලිටරිය කොලඹ දී "නැගෙනහිර නවෝදය" නමින් දැවැන්ත ප්‍රීත්‍යෝත්සවයක් පැවැත්වී ය. දැන් මිලිටරිය උතුරෙහි ඉතිරිව පවතින එල්ටීටීඊ බල කඳවුරු වෙත සිය අවධානය යොමු කොට ඇති අතර, මරනයට පත් වන්නන්, තුවාල ලබන්නන් සහ අවතැන් වන්නන් සංඛ්‍යාව දිගින් දිගට ම ඉහල යමින් පවතී.

සාම සාකච්ඡාවලට පිවිසීමට සූදානමින් සිටින බව රාජපක්ෂ එක්සත් ජාතීන් හමුවේ මවා පාන මුත්, ආන්ඩුව උත්සාහ දරමින් සිටින්නේ එල්ටීටීඊය මුලුමනින් විනාශ කර දැමීමට ය යන්න ගැන කිසිදු සැකයක් ඇති නො වන්නට ඔහුගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ වග බලා ගෙන තිබේ. සතියකට පෙර ජනාධිපතිවරයා ද සහභාගි වූ මිලිටරි උත්සවයක දී කතා කරමින් ආරක්ෂක ලේකම් මෙසේ ප්‍රකාශ කලේ ය: "මේ දැන් ලඟා වෙන්න දුෂ්කර බව අපට පේන දේශපාලනික විසඳුමක් මත පදනම් වෙන්න යන්නෙ නැතිව මිලිටරියෙ බලය යොදා ගෙන එල්ටීටීඊය පරද්දන්න අපි ලෑස්ති යි. දේශපාලන විසඳුමක් සොයා ගන්න නම්, අපි සියයට 50කින් නෙවි, සියයට 75කින් නෙවි, සියයට 100කින් ත්‍රස්තවාදය පරාජය කරන්න ඕනෑ."

මෙම උත්සවයම ද අර්ථභාරීය. එය එල්ටීටීඊයට අයත් යැයි නාවික හමුදාව කියා සිටින යාත්‍රා තුනකට පහර දී ගිල්වා විනාශ කිරීම සම්බන්ධයෙන් අන දෙන නිලධාරීන්ට සහ නැවියන්ට පදක්කම් පැලඳවීම සඳහා පැවත්වූ සම්මාන ප්‍රදානෝත්සවයකි. යාත්‍රා පැවතුනේ ශ්‍රී ලංකාවට අයත් මුහුදු ප්‍රදේශයේ නො වේ. ශ්‍රී ලංකා මුහුදු සීමාවෙන් නාවික සැතපුම් 1.400ක් ඔබ්බෙන් ජාත්‍යන්තර මුහුදු ප්‍රදේශයෙහි ය. සැප්තැම්බර් 23 වන දා සන්ඬේ ටයිම්ස් පුවත්පතේ පල වූ වාර්තාවට අනුව, යාත්‍රාවලට ගොඩ වීම සඳහා හෝ ඒවායේ තිබූ බඩු තොග මොනවා දැයි නිශ්චය කර ගැනීම සඳහා හෝ කිසි ම ප්‍රයත්නයක් දරා නැත. එය වනාහි ශ්‍රී ලංකාන්ඩුව ගෙන යන අප්‍රකාශිත යුද්ධයේ තවත් විවෘත ආක්‍රමනකාරී ක්‍රියාවකි.

එක්සත් ජාතීන් හමුවේ කල සිය විනාඩි 10 කතාව තුල දී ජනාධිපති රාජපක්ෂ 13 වතාවකට නොඅඩු වාර ගනනක් "ත්‍රස්තවාදී" සහ "ත්‍රස්තවාදය" යන වචන යොදා ගත්තේ ය. බුෂ් පාලනාධිකාරයේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" පොදු වූ අරමුනක් ඇති කර ගැනීමට වෙහෙස දරමින් හේ මෙසේ කියා සිටියේ ය: "අහිංසක ජීවිත විනාශ කරන්නට පෘථිවි ගෝලයේ බොහෝ තැන්වල සිය නිය පහුරු විහිදා සිටින කෲර ත්‍රස්තවාදයෙන් ඇති වන මහා ව්‍යසනයේ සෘජු අත්දැකීම් ලත් බොහෝ සාමාජික රටවල් අද මෙම මන්ඩලය තුල නියෝජනය වෙනවා." තම රට ත්‍රස්තවාදය පිලිබඳව වූ එක්සත් ජාතීන්ගේ 11 වන සහ 13 වන සම්මුතීන්ට සහාය දෙන බව පෙන්වා දුන් ඔහු, "ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධය" තුල දී ශ්‍රී ලංකාව සිටින "ඉදිරි ස්ථානය" පිලිබඳව පුවච්චානම් දෙඩී ය.

නින්දිත දේශපාලනික ගනන් බැලීම කවරක් ද යන්න පැහැදිලි ය. ඇෆ්ඝනිස්ථානය සහ ඉරාකය තුල බුෂ් පාලනාධිකාරය කර ගෙන එන සාපරාධී ක්‍රියාවන්ට සහාය දීම මගින් එල්ටීටීඊයට එරෙහිව ගෙන යන තමන්ගේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" එක්සත් ජනපදයේ සහ අනෙකුත් ප්‍රධාන බලවතුන්ගේ සහාය ලබා ගැනීමට රාජපක්ෂ බලාපොරොත්තු වේ. බෙදුම්වාදී එල්ටීටීඊය "ත්‍රස්තවාදය" සමග අනන්‍ය කිරීම මගින් හේ දිවයින තුල පවත්නා 24 වසරක ලේ වැකි යුද්ධයේ සැබෑ මූලයන් සඟවන්නේ ය. ඒ මූලයන් පවත්නේ රාජපක්ෂ ආන්ඩුවත් 1948 දී නිදහස ලැබීමෙන් පසු බලයට පත් වූ පූර්වයෙන් පැවති සියලු ආන්ඩුත් පදනම් වී ගත් ක්‍රමානුකූල දෙමල විරෝධී වෙනස්කම් කිරීම් තුල යි.

"ත්‍රස්තවාදී" විධික්‍රම සම්බන්ධයෙන් ගත් කල, වාර්ගික ආතතීන් ඉහල නැංවීම පිනිසත් රටේ දෙමල සුලුතරය තුල "භීෂනය" පිලිබඳ හැඟීමක් ඇති කිරීම පිනිසත් අහිසංක සිවිල් වැසියන් ඝාතනය කිරීම සඳහා එල්ටීටීඊය තරමට ම ශ්‍රී ලංකා මිලිටරිය ද අධිෂ්ඨාන සහගත වී සිටී. ආරක්ෂක හමුදා සමස්ත දෙමල ජනයා ම සිය සතුරා ලෙස සලකයි. පසු ගිය වසරෙහි සිදු කල මිලිටරි ආක්‍රමනවල දී, කාලතුවක්කු සහ මෝටාර් යොදා ගනිමින් සන්නද්ධ හමුදා සිවිල් ජනයා වෙසෙන ප්‍රදේශවලට ගුවනින් බෝම්බ හෙලා තිබේ. විවේචනයට ලක් වූ විට වොෂින්ටනයේ සම්මත මුසාව යොදා නිමින් ආන්ඩුව ප්‍රතිචාර දක්වා තිබේ: එනම්, " ත්‍රස්තවාදීන්" සිවිල් වැසියන් "මානව පලිහක්" ලෙස යොදා ත්නා බව යි. හටකායන් හෝ ඒ හා සන්ධානගතව සිටින පැරාමිලිටරි කන්ඩායම් සම්බන්ධ කොට ගත් මැනවින් සංවිධිත ඝාතක කල්ලි යොදා ගැනීමට යොමු වූ තත්ත්වය යටතේ සිය ගනක් ජනයා "අතුරුදන් වී" හෝ ඝාතනයට ලක් වී තිබේ. ඔවුන්ගෙන් වැඩි දෙනා දෙමල ජාතිකයෝ වෙති.

ඉරාකයේ එක්සත් ජනපද වාඩි ලා ගැනීම පිලිබඳ බුෂ් පාලනාධිකාරයේ රැවටිලිකාර ප්‍රකාශ දෝංකාර නංවමින්, හමුදාව "නැගෙනහිර ත්‍රස්තවාදයෙන් මුදා ගෙන නීතිය සහ සාමය පිහිටුවා" ඇතැයි රාජපක්ෂ ප්‍රකාශ කලේ ය. "නැගෙනහිර පුනරුත්ථාපනය කිරීමේ සහ යලි ගොඩ නැගීමේ දැවැන්ත වැඩ සටහනක්" පිලිබඳව පාරම් බෑ ඔහු විදේශීය ආයෝජන සහ ආධාර කැඳවා ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීය. යථාර්ථය නම් ශ්‍රී ලංකා මිලිටරිය උතුරෙහි සහ නැගෙනහිරෙහි සිය පාලනය යටතේ පවතින ප්‍රදේශ තුල වාඩි ලා ගත් හමුදාවක් පරිද්දෙන් කටයුතු කරන්නේ ය යන්න යි. ඡන්දයෙන් පත් වූ පලාත් අධිකාරීන් නැත. "ආරක්ෂාව" කෙරෙහි දුරස්ථ වශයෙන් බලපාන කුමන කරුනක් සම්බන්ධයෙන් වුව ද මිලිටරියට නිෂේධ බලයක් පවතී. ඒ තත්ත්වය තුල කොලඹ ආන්ඩුව සහ රාජ්‍ය නිලධරය ප්‍රතිපත්ති පිලිබඳ තීරන ගනිති.

නැගෙනහිර "පුනරුත්ථාපනය සහ යලි ගොඩ නැගීම" සම්බන්ධයෙන් ගත් කල කිව යුත්තේ, ආන්ඩුව විදේශීය ආයෝජකයන් කැඳවා ගැනීමේ අරමුනෙන් සාම්පූර්හි ඉදි කරන්නට බලාපොරොත්තු වන නිදහස් වෙලඳ කලාපයට ඇතුලත් වන විශාල ප්‍රදේශයක් අධිආරක්ෂිත කලාපයක් බවට පත් කොට ඇත යන්න යි. මේ හේතුවෙන් ප්‍රදේශයේ දහස් ගනන් නිවැසියන් සිය නිවෙස්වලින්, ගොවිපලවලින් සහ ව්‍යාපාරවලින් අවතැන් වී තිබේ.

මානව හිමිකම් පිලිබඳ ශ්‍රී ලංකාවේ දරුනු වාර්තාව ගැන කල විවේචනවලට ප්‍රතිචාර දැක්වීමේ දී ජනාධිපති රාජපක්ෂ ඔහුගේ සම්මත විධික්‍රමය යොදා නො ගන්නට වග බලා ගත්තේ ය: එනම්, ඕනෑ ම විවේචකයෙකු එල්ටීටීඊ සහකරුවෙකැයි හෙලා දැකීමේ විධික්‍රමය යි. මේ වසර තුල මීට පෙර දී ආරක්ෂක ලේකම් රාජපක්ෂ, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට " අයුතු බලපෑම් කිරීම" ගැන එක්සත් ජාතීන්ට චෝදනා කල අතර, පසු ගිය 30 වසර පුරා එල්ටීටීඊය ජාත්‍යන්තර දේහය මුලුමනින් ම "විනිවිද ගොස් ඇතැ"යි කියා සිටියේ ය. එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලය හමුවේ

සිය සොහොයුරාගේ මුග්ධ චෝදනාව පුනරුච්චාරනය නො කරන්නට වග බලා ගත් නමුත්, ඔහු මානව අයිතීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගොදුරක් බවට පත් වී සිටින බව ප්‍රකාශ කලේය.

රාජපක්ෂ මෙසේ කියා ගෙන ියේ යඃ "බුදු දහමේ ප්‍රතිපත්තිවලින් මෙහෙයවෙන අපි බොහෝ කාලයක් තිස්සේ අපේ සහෝදර මිනිස්සුන්ගේ අයිතීන්ට ගරු කරනවා. ඒ නිසා ඒ වටිනාකම දැන හඳුනා ගන්න ගෝලීය යුද්ධ හෝ මිලියන සංඛ්‍යාත ජනයා මරනයට පත් වීම අත්දකින්න අපට අවශ්‍ය වෙන්නෙ නැහැ. අධිරාජ්‍යයන් ගොඩ නැගීමේ අරමුනෙන්, වානිජ්‍යමය වාසි හෝ ආගමික උත්තරීතර භාවය අත් කර ැනීමේ අරමුනෙන් සහෝදර මිනිසුන් මත දුක්පීඩාවන් පැනවීමේ වාර්තාවක් මගේ රටට නැහැ."

යුද්ධය සහ කොල්ල කෑම සම්බන්ධයෙන් බටහිර බලයන් සතු ඉතිහාසය වෙත වක්‍රව ඇඟිල්ල දිගු කොට ඔවුන්ගේ කුහකකම අඟවන අතරේ රාජපක්ෂ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වාර්තාව මුසාකරනය කලේ ය. සිංහල බෞද්ධ ආධිපත්‍යය සඳහා වූ යුද්ධයක අතිශය උද්‍යෝගී නායකයන් අතර බෞද්ධ භික්ෂූන් සිටි පසු ගිය 24 වසර තුල පැවති වාර්ගික ම්ලේච්ඡත්වය ගෙන හැර පෑම පමනක් වුව මෙහි ලා ප්‍රමානවත් ය. රාජපක්ෂගේ සැඟවුනු පනිවුඩය පැහැදිලි යඃ එනම්, පීඩාවකින් තොරව යුද්ධය කර ගෙන යාමටත් දිවයිනේ දෙමල සුලුතරය භීතියට පත් කිරීමටත් ප්‍රධාන බලයන් ශ්‍රී ලාංකික මිලිටරියට ඉඩ දෙන තාක් කල් අපි බටහිර අධිරාජ්‍යවාදය කල අපරාධ ගැන නිහඬව ඉන්නම් යන්න යි.

ශ්‍රී ලංකාවේ පාලක කවයන් තුල සිටින කිසිවෙකු රාජපක්ෂගේ කතාව තුල පවතින මුසාකරනයන්ට අභියෝග කොට නැත. සැප්තැම්බර් 28 වන දා, ශ්‍රී ලංකාවේ "ලිබරල්" හඬ යැයි සැලකෙන ඩේලි මිරර් පුවත්පත, "ජනාධිපති සිත් කා වදින අයුරින් ශ්‍රී ලංකාවේ තත්ත්වය ඉදිරිපත් කරයි" යන හිසින් යුතු කතුවැකියක් ලිවී ය. මානව අයිතීන් සම්බන්ධයෙන් ආන්ඩුවට දොසක්වත් නොකියූ කතුවැකිය, "ත්‍රස්තවාදය සමග වඩා ඵලදායක අයුරින් නුදෙනු කිරීමට රටවල් දරන ප්‍රයත්නයන්ට බාධා කරන්නට ත්‍රස්තවාදීන් සහ ඔවුන්ගේ සහායකයන් මේ කරුන ප්‍රයෝජනයට ගන්නා බව පැහැදිලි යැ"යි ප්‍රකාශ කරමින් ස්ථිරසාරව රාජපක්ෂ සමග පෙල ගැසී ගත්තේ ය.

නිහඬතාවෙන් තහවුරු වන්නේ, කවර උපායාත්මක වෙනස්කමක් පැවතිය ද, දේශපාලන සහ මාධ්‍ය සංස්ථාපිතයේ සියලු කොටස් රාජපක්ෂගේ යලි ආරම්භ කරන ලද යුද්ධයට මුක්කුව දෙන බවත් ඔහුගේ අපරාධවලට හවුල් වන බවත් ය.

© www.wsws.org